## තනතුරු - ඇබෑර්තු

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට, වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. සුදුසුකම්:*

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබිය යුතුය.

III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

**සටහන:**අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඉහත සඳහන් සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ තමා විසින් සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

*02. තෝරා ගැනීමේ ක්‍රමය:*

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව වයඹ පළාත් ආණ්ඩුකාරවර ලේකම් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

සියලුම අයදුම්පත් (ආදර්ශ අයදුම්පත්‍රය www.psc.nw.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය) විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2023.04.24** වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.)**"ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, මාලිගාව, කුරුණෑගල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

04. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතුවේ.

05. මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුවේ.

06. මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතුවේ.

මෙයට,

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආණ්ඩුකාරවර ලේකම්,
ආණ්ඩුකාරවර කාර්යාලය,
වයඹ පළාත.

2023.03.27